වෙදහෙදකම්

# සොබාදහමට වඩාත් සමීප වෛද්‍ය ක්‍රමයක්



වෛද්‍ය ටී. සී. පීරිස්

ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාවේ වර්තමාන සභාපති වෛද්‍ය ටී. සී. පීරිස් සමඟ කෙරුණු සංවාදයකි. ඉන්දියාවේදී සිය හෝමියෝපති වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන ලද ඔහු කලක් එහි සහකාර ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරයෙක් වශයෙන් සේවය කර ඇත. අද දිනයේදී ජාත්‍යන්තර හෝමියෝපති ලීගයේ ද (පීනීවා) ඕස්ට්‍රේලියානු, ආසියානු හා ඇමෙරිකානු හෝමියෝපති සම්මේලනවල ද නිත්‍ය සාමාජිකයකුවන වෛද්‍ය පීරිස් ශ්‍රී ලංකාවේ ආයතන කීපයකම හෝමියෝපති උපදේශකවරයෙකු හා කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කරයි. එසේම හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ ග්‍රන්ථ කීපයක් ද ශාස්ත්‍රීය ලිපි විශාල ප්‍රමාණයක් ද ඔහු විසින් පසුගිය දශක කීපය තුළ සම්පාදනය කොට ඇත.

**ප්‍රශ්නය :–** "හෝමියෝපති" වෛද්‍ය ක්‍රමය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

**පිළිතුර :–** මෙය 19 වන සියවසේ දී පමණ ජර්මන් ජාතික වෛද්‍යවරයකු වන මහාචාර්ය සැමුවෙල් ෆෙඩ්රික් හනිමාන් විසින් හඳුන්වා දුන් බටහිර වෛද්‍ය ක්‍රමයක්. ඇත්තටම මෙහිදී මහාචාර්ය හනිමාන්ගේ අරමුණ වුයේ පවතින බටහිර වෛද්‍ය ක්‍රමය විද්‍යාත්මකව මනුෂ්‍ය ශරීරයට වඩාත් හිතකර ලෙස ඉදිරිපත් කිරීමයි. මේ සඳහා ඔහු බොහෝ අත්හදා බැලීම් පෞද්ගලිකව සිදුකළා. ඒ දිනවල මැලේරියාව සඳහා භාවිත කළේ සින්කෝනා ගසේ පොත්ත මද්‍යසාරයෙන් පැසවා සාදා ගන්නා යුෂක්. හනිමාන් වෛද්‍යතුමා මැලේරියාව නොමැතිව මෙම යුෂ පානය කළා. ටිකෙන් ටික දවසින් දවස ඔහුගේ ශරීරයේ වෙනස්කම් සටහන් කළා. ටික දිනක් යනවිට හනිමාන් තුමාට මැලේරියා ලක්ෂණ පහළ වුණා.



හෝමියෝපති පරිගණක වෛද්‍ය සේවය පිළිබඳව වෛද්‍ය ටී. සී. පීරිස් මහතා සෞඛ්‍ය ඇමතිතුමා, මාතලේ නගරාධිපතිතුමා, අමාත්‍යාංශ අතිරේක ලේකම් බුද්ධික විජේරත්න ඇතුළු පිරිසට කරුණු පැහැදිලි කරමින්.

මෙයින් ඔහු වටහා ගත්තා මැලේරියාව පාලනය කරන්නේ තවත් ඒ හා සමානම ජීවවිද්‍යාත්මක බලවේගයකින් බව. මෙන්න මේ ආකාරයට එවකට තිබූ රෝග හා ඖෂධ පිළිබඳව පරීක්ෂණ පැවැත්වූවා. පැරණි වට්ටෝරු නැවත අධ්‍යනය කළා. මෙයින් ඔහු සිමිල සජ්රින් හෙවත් සහසම්බන්ද සමාන බලවේග මගින් රෝග සමතුලනය කරන සිද්ධාන්තය ලොවට ඉදිරිපත් කළා. එය තමයි හෝමියෝපති ශාස්ත්‍රයේ ආරම්භය හා සරලම සිද්ධාන්තය. මෙයින් පසුව එක් එක් පුද්ගලයාගේ මානසික හා ශාරීරික ලක්ෂණ හඳුරා ඖෂධ නියම කරන බරපතල ක්‍රමවේදයක් හා සම්පූර්ණයෙන්ම පශ්චාත් උපද්‍රව වලින් තොර අති දියුණු රසායනික ඖෂධ ක්‍රමවේදයක් හනිමාන් තුමා ලොවට ඉදිරිපත් කළා. අද දිනයේ අපි භාවිත කරන්නේ මෙම ක්‍රමවේදයයි. එමෙන්ම දෙවැනි ලෝක මහා සංග්‍රාමයේදී සහ 1850 ගණන්වල යුරෝපය පුරා කොළරා වසංගතය පැතිරී ගිය විට හෝමියෝපති ඖෂධ ඉතා සාර්ථකව රෝග මර්ධනයට දායක වුණා. මේ නිසා යුරෝපයේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පැතිරුණා. මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ජර්මනිය, රුසියාව, ඇමෙරිකාව හා ඉන්දියාව, පාකිස්ථානය ආදී රටවලත් අද හෝමියෝපති සාර්ථකව ව්‍යාප්ත වෙලා තියෙනවා.

**ප්‍රශ්නය :–** මෙම විකල්ප වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවට පැමිණියේ කෙසේද ? එහි ඉතිහාසය කුමක්ද ?

**පිළිතුර :–** ශ්‍රී ලංකාවේ හෝමියෝපති සංගමයේ ප්‍රථම සභාපති ලෙස දෙස්තර කොරයා හැඳින්විය හැකියි. හැබැයි ඒ කාලේ නිලවරණ තිබුණේ නැහැ. කොහොම නමුත් ඒ ආරම්භක අවධියේ එතුමා මෙම ක්ෂේත්‍රයට මෙහෙවරක් කළා. ඔහුට අමතරව, 1908 දී පමණ කැප්ටන් සමරවීර කියන හමුදා නිලධාරියත් මෙම වෛද්‍ය ක්‍රමය හඳුන්වා දීමට වෙහෙසිලා තියෙනවා. එමෙන්ම හලාවත හිටපු දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී දෙස්තර වල්පොලත්, කල්කටාවේ අෂ්ටාංග වෛද්‍යවරයෙකු වන දෙස්තර බබාපුල්ලේත් ඉතිහාසයේදී මෙම වෛද්‍යක්‍රමය ප්‍රචලිත කරන්නට වෙහෙසිලා තියෙනවා. කොහොම නමුත් 1970 දී තමයි, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය රජය පිළිගත්තේ. 70 හා 80 යුගයේදී චීන කටු හැදූරූ අය හා වෙනත් ව්‍යාජ පුද්ගලයන් හෝමියෝපති නම භාවිත කරමින් රට පුරා ව්‍යාජ හෝමියෝපති ක්‍රමයන් ව්‍යාප්ත කළා. මෙය ඉතා අවුල් සහගත තත්ත්වයක් වුණා. එමෙන්ම උපාධි ඇති පිළිගත් වෛද්‍යවරුන් ලෙස සිටින සුළු පිරිස අතරත් නොයෙකුත් අර්බුද තිබුණා. එමනිසා මෙතෙක් සිටි සෞඛ්‍ය ඇමතිවරුන් කිසිවකුට මෙම අර්බුදය විසඳීමට නොහැකි වුණා. ඒ තරමට ශ්‍රී ලංකාවේ හෝමියෝපති අවුලක් වෙලා තිබුණා. නමුත් වත්මන් සෞඛ්‍ය අමාත්‍ය නිමල් සිරිපාල ඇමතිතුමා සෘජු ලෙසම මෙම ප්‍රශ්නයට මැදිහත් වුණා. ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවා ඉතිහාසයේ ප්‍රථම වරට සාධාරණ නිලවරණයක් තියන්නත් එතුමා සමත් වුණා. එමනිසා මෙතෙක් නිලවරණ කිසිත් නොතිබුණු වෛද්‍ය සංගමය, වර්තමානයේදී ලෝකයේ පිළිගත් වෛද්‍ය සභාවක් බවට පත්වෙලා තියෙනවා. ඉතින් අද දිනයේ ඉතිහාසයේ ප්‍රථම වරට ක්‍රමයත් වැඩපිළිවෙළක් මේ යටතේ ක්‍රියාත්මක වෙනවා. එමෙන්ම රටපුරා සිටින ව්‍යාජ හෝමියෝපති වෛද්‍යවරුන්ට එරෙහිව එක්කෝ නීතිය ක්‍රියාත්මක කිරීමටත්, එසේ නැතහොත් විධිමත් ක්‍රමයකින් ඔවුන්ව සම්බන්ධ කරගැනීමේ ක්‍රමයක් පිළිබඳව හෝ මේ මොහොතේ දී අප යොමුවෙලා තියෙනවා.

**ප්‍රශ්නය :–** ශ්‍රී ලංකාවේ හෝමියෝපති වෛද්‍යවරයෙක් වශයෙන් ඔබතුමා කරන ලද වෛද්‍ය සමීක්ෂණ මොනවාද ? ඒ උදෙසා විශේෂ හෝමියෝපති වෛද්‍ය ව්‍යාපෘති මේ මොහොතේදී ක්‍රියාත්මක වෙනවාද?

**පිළිතුර :–** ප්‍රධානම සමීක්ෂණ දෙකක් යටතේ සිදුවන ව්‍යාපෘති දෙකක් පිළිබඳව අපට කරුණු දක්වන්න පුළුවන්. එකක් ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශවල දක්නට ලැබෙන අයඩින් ඌනතාව. මෙම තත්ත්වය බෙහෙවින් දක්නට ලැබෙන රත්නපුර කොළඳගම කියන ගම මෙහිදී අපේ සමීක්ෂණයට ලක් වුණා. එමෙන්ම මෙරට සම්මතය තුළ කෙරෙන අයඩින් භාවිතයටත් මම පෞද්ගලිකව එකඟ නැහැ. මොකද අයඩින් කියන්නේ ඌර්දවපාතනය වන මූලද්‍රව්‍යයක්. ඒ කියන්නේ නිකං වතුරේ දියවෙන්නෙත් නැති, රත් කළ විට දිය නොවී කෙළින්ම වාෂ්ප වෙන මූල ද්‍රව්‍යයක්. මෙම තත්ත්වය සලකා බැලුවම අයඩින් මිශ්‍ර ලුණු භාවිතය වගේ දේ මෙයට නිශ්චිත ප්‍රතිකර්ම නෙමෙයි. නමුත් අපේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේදී මෙයට නිශ්චිත ප්‍රතිකාර තියෙනවා. රෝගයේ කල්ගත නොවුනු ළදරු අවස්ථාවේදී සම්පූර්ණයෙන් සුව කරන්න පුළුවන්.

රෝගයේ වයස අනුව බෙහෙත් කරන්නට වන කාලයත් අඩු වැඩි වෙනවා. පරිසර ප්‍රශ්න, පෝෂණය වගේම කෘමිනාශක භාවිතයත් මෙයට හේතුවක් වෙන්න පුළුවන්. කෙසේ වෙතත් මේ සඳහා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සාර්ථක වෙලා තියෙනවා කියලා කියන්න පුළුවන්.

අප කරගෙන යන අනිත් ව්‍යාපෘතිය තමයි මත් විසරණය. මත්ද්‍රව්‍ය භාවිතයට මිනිසා පෙළඹෙන්නේ දෙආකාරවයි. එකක් මනසින් පෙළඹවීම. අනික ශාරීරික පෙළඹවීම. හෝමියෝපති ක්‍රමයේ දී මෙම ස්වරූප දෙකම දැඩි ලෙස සැලකිල්ලට භාජනය කරනවා. එමෙන්ම යම් පුද්ගලයන්ට ආවේනික පරවේණික ලක්ෂණත් රෝගවලට හේතුවන බව හනිමාන් තුමා පෙන්වා දී තිබෙනවා. එමනිසා සෑම රෝගියෙක් ම වෙන්කරගෙන ප්‍රතිකාර කිරීමක් අප සිදුකරනවා. මොකද මනස, ශරීරය, පරවේණිය ජාන එකිනෙකට වෙනස් නිසා. ඒකයි මේක දියුණු වෛද්‍ය ක්‍රමයක් කියලා කියන්නේ. අද ඒක ඔප්පුවෙලා තියෙනවා. මුලු ලෝකයේම මත් විසරණය අසාර්ථක වෙනකොට හෝමියෝපති සාර්ථකවෙලා තියෙනවා. දැන් බලන්න හෙරොයින් වලට ඇබ්බැහි වුණු කෙනෙකුට හෙරොයින් නොබී ඉන්න කොට කබ, කඳුලු, සැරව, ශුක්‍රානු, මළපහ ආදී මාර්ගවලින් විරමන ලක්ෂණ පහළ වෙනවා. ඉතින් සම්මත බටහිර වෛද්‍ය ක්‍රමයේ දි හෙරොයින්වලට ආදේශන ලෙස රයිෆනෝල් වගේ ඖෂධ නියම කරනවා.

සමහර වෙලාවට මේ වගේ ආදේශන ඖෂධ කීපයක් දෙනවා. ඒක මහ පුදුම කොක්ටේල් ක්‍රමයක්. මේ සියලු දේ කරන්නේ ලබාගත් මත්ද්‍රව්‍යයට ආදේශන ලෙස. ඉතින් ඔයිට හොඳයිනේ හෙරොයින්ම දෙන එක. නමුත් අපේ වෛද්‍ය ක්‍රමය එහෙම නැහැ. මාසයක් තිස්සේ පල කරන විරමන ලක්ෂණ අපි දවස් දෙක තුනකින් ඉවර කරනවා. නිදසුනක් ලෙස මාසයක් තිස්සේ කරන කඳුලු කබ ගැලීම දවස් කීපයකින් අවසන් කරනවා. ටිකක් අමාරුයි නමුත් සුවය ස්ථිරයි.

මෙසේ විරමනය වේගවත් කරලා අවසාන කරාට පසු අප මානසික හා ශාරීරික පෙළඹවීම ඖෂධ මගින් ඒ ඒ රෝගියාගේ පරවේණික ලක්ෂණ මත සිදුකරනවා.

සියයට සියයක් ස්ථිරවම අපි ප්‍රකාශ කරනවා හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ අතුරු ආබාධ කිසිවක් නැහැ කියන එක. මත් විසරණයේදීත් අයඩින් ඌනතාවයේදීත් අපි මේක ඔප්පු කරලා තියෙනවා.


**ප්‍රශ්නය :–** හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මත්විසරණයට ගලගණ්ඩයට වගේම අනිකුත් රෝගවලටත් ප්‍රත්‍යක්ෂ වෛද්‍ය ක්‍රමයක් ද?

**පිළිතුර :–** පැහැදිලිවම මෙය බටහිර වෛද්‍ය ක්‍රමය මෙන් සෑම රෝගයක් සඳහාම පරිපූර්ණ වෛද්‍ය ක්‍රමයක්. හදිසි රෝග, කල්ගතවූ රෝග, හදිසි අනතුරු, අක්ෂි වෛද්‍ය, දන්ත වෛද්‍ය, පූර්ව සහ පසු ශල්‍ය වෛද්‍ය චිකිත්සාව, පූර්ව සහ පසු ප්‍රසව හා නාරිවේදය, ළමාරෝග, ස්ත්‍රී රෝග ආදිය සඳහා මෙය පරිපූර්ණ වෛද්‍ය ක්‍රමයක්. ප්‍රශ්නයකට තියෙන්නේ මේ සියලු රෝග සඳහා බෙහෙත් කරන්නට අවශ්‍ය පහසුකම් ලංකාවේ නැහැ. නමුත් ඉන්දියාව, පාකිස්ථානය, ජර්මනිය, බ්‍රිතාන්‍ය, ඇමෙරිකාව වගේ රටවල්වල හෝමියෝපති ශල්‍යාගාර රෝහල් පිහිටලා තියෙනවා. මෙහේ නැහැ. ඒකයි ප්‍රශ්නය. නිදසුනක් වශයෙන් මානසික රෝග, පිළිකා, සඳහාත් හෝමියෝපති අතිසාර්ථකයි. නමුත් ඒ වගේ බරපතල තත්ත්වවලට නිශ්චිත පහසුකම් නොමැතිව අතගහන්න බයයි. ඉතාම පෞද්ගලික මට්ටමින් රෝගියාගේ ඥාතීන්ගේ එකඟත්වය මත තමයි මෙම රෝගවලට ප්‍රතිකාර කරන්නේ. නිශ්චිත උපකරණ පහසුකම් නැතුව බෙහෙත් කරන්න හරිම අමාරුයි. හුඟාක් වෙහෙසකරයි. නිදසුනක් වශයෙන් මානසික රෝග හෝමියෝපති ක්‍රමයෙන් හොඳ කරන්න පුළුවන්. ඒත් මේ ක්‍රමය අනුව පළමු අදියරේදී මානසික රෝග උත්සන්න වෙනවා. ඉතින් ඒ උත්සන්න අවස්ථාවේදී රෝගියා තැබිය යුතු විශේෂ චිකිත්සාගාර ලංකාවේ නැහැ. ඉතින් රෝගියාගේ ඥාතීන් ඒ වගකීම ගත යුතුයි. මෙවැනි ගැටලු නිසයි සමහර රෝගවලට ප්‍රතිකාර කරන්න අපහසු.

**ප්‍රශ්නය :–** ඔබ අද ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාවේ තිලවරණයෙන් පත්වුණු ප්‍රථම වෛද්‍යවරයා. දැනට තිබෙන ගැටලු විසඳගෙන අනාගතයේදී මෙම වෛද්‍යක්‍රමය ව්‍යාප්ත කිරීමට යොදන සැලසුම කුමක් ද?

**පිළිතුර :–** අද දිනයේ මට පැවරී තිබෙන විශාලම වගකීම තමයි මෙම වෛද්‍ය ක්‍රමය නිශ්චිතවම ලංකාවේ ව්‍යාප්ත කිරීම. ඒ සඳහා රාජ්‍යය අනුග්‍රහය සහිතව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හා රෝහලක් අනාගතයේදී ඉදිකිරීමට බලාපොරොත්තු වෙනවා. මොකද අද දිනයේ හෝමියෝපති වෛද්‍ය උපාධිය සඳහා ඉන්දියාවට හෝ පාකිස්ථානයට යන්න වෙනවා. ලක්ෂ හතරක් පමණ වියදම් වෙනවා. මෙය ක්‍රියාත්මක කළයුතු මූලික අවශ්‍යතාවක්. පසුගිය කාලයේ රජයේ "සුව උදාන" සංකල්පය යටතේ මැදවච්චියේ පවත්වපු හෝමියෝපති සායනය අතිශයෙන් සාර්ථක වුණා. එමනිසා මෙය තවදුරටත් රටේ ප්‍රචලිත කිරීමේ අරමුණින් වසර 2000 වන විට හෝමියෝපති සායන දිස්ත්‍රික්කයකට 1 බැගින් ව්‍යාප්ත කරන්න බලාපොරොත්තු වෙනවා.

එමෙන්ම යුද්ධයේදී තුවාල ලබන සොල්දාදුවන් වෙනුවෙන් ශල්‍ය හා ඖෂධීය මට්ටමින් හෝමියෝපති සේවාව ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වෙනවා. මොකද මෙම වෛද්‍ය ක්‍රමයෙන් ඉතා ඉක්මනින් තුවාල හොඳ කරන්නත්, මනස සන්සුන් කරන්නත්, බිඳුනු අස්ථි බද්ධකරන්නත් පුළුවන්. දෙවන ලෝක යුද්ධ කාලයේදී ජර්මනියේ හෝමියෝපති ප්‍රසිද්ධ වුනේ මෙම ඉක්මන් සුවය නිසා. තවද රට පුරා විසිරී සිටින ලියාපදිංචි වූ, ලියාපදිංචි නොවූ, සුදුසුකම් ලත්, සුදුසුකම් නොලත් හෝමියෝපති වෛද්‍යවරුන් ක්‍රමවත් ලෙස එකතු කිරීමේ වර්ග කිරීමේ ක්‍රමයක් නීත්‍යානුකූලව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. අවසාන වශයෙන් 21 සියවස උදෙසා විශ්වාසවන්ත, සරල, ක්ෂණික, අතුරු ආබාධවලින් සම්පූර්ණයෙන් තොර සොබාදහමට ඉතාම සමීප වෛද්‍ය ක්‍රමයක් ලෙස මෙම විෂ රහිත වෛද්‍ය ක්‍රමය ලංකාවේ සුවසෙත උදෙසා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වෙනවා.



ආනමඩුව මැදිමහ විදුහලේ සිසු සිසුවියන් හෝමියෝපති ප්‍රදර්ශනය නරඹමින්

**සාකච්ඡා කළේ-සේයාරූ**

**- මාක් ඉන්දික සමරසේකර**